බුලත්

ආදියේ සිටම හෙළයා බුලත් හා පවතින්නේ පුදුම බැඳීමකි. සැරබව කියනුයේ -බත බුලතින් සරු" බවයි. බත් මෙන්ම බුලතද ගරුකොට සලකූහ. බුලත්, හාල්, මීල මුදල් පුජනීය වස්තු ලෙස සැලකූහ. බුලත් වලට විශේෂ ගරු කිරීමක් දැක්වූහ.

බුලත් කන්ට මම ගේකට යන	කලට
තලප කන්ට කිව්වා උන්දෑ මේ	මට
තලප කියා උගෙ පෝපත දකින	විට
එදා පටන් අප්පිරියයි කලප	මට

මේ කවියෙන් කියැවෙන ලෙස බුලත් ඉල්ලා කෑමට උවත් හෙළයා මෑළළි නැත. නමුත් පිරිසිදුකම ඉතා අගේ කොට සැලකූ බවද පෙනේ. (තලප බෙදූ පෝපත කොලපතින් සකසාලා) අපිරිසිදුකම මේ කවියෙන් මොනවට ගම්‍යවේ.

පුරාණයේ පනිවිඩයක් යමෙක් අත තවකෙනෙකු යැවීමේදී බුලත් කොළයක් හෝ බුලත් අතක් (කොළ 40 ක්) යැවීම සිරිතකි. බුලත් භාරගතහොත් අනිවාර්යෙන්ම එම පණිවිඩයෙන් කියවුණ කරුණු ඉටු කරයි. වැඩපළක් කරගත යුතු අවස්ථාවල බුලත් බෙදීම සිදු කරයි. තමාගේ ගොවිතැන් වැඩ හා අනෙකුත් මංගල්‍ය මෙන්ම අවමංගල්‍යා ආදී සියලු දේ වලදී බුලත් දීමේ ක්‍රම ගනනාවකි.

තව කටයුත්තට දස දෙනෙක් අවශ්‍ය නම් දස දෙනෙකුට බුලත් බෙදනු ලැබේ. අනිවාර්යෙන්ම එම දස දෙනා එම වැඩය සඳහා පැමිණේ. බුලත් විඩට සුවද වර්ග සමග තැබී එම සිරිතේම කොටසකි. තමාට වඩා වැඩිමහල් අයෙකුට බුලත් දෙනු ලබන්නේ නැටි පැත්ත වැඩිගිටියා වෙතය. මගුලට උඩ අතටත් අවමගුලට කනපිටටත් බුලත් දෙනු ලැබේ. අවමගුල් ගෙදර බුලත් තට්ටුවේ බුලත් කනපිට තබන්නේ එම සිරිත නිසාය.

තමාගේ වයසට බාල අයට බුලත් දෙනු ලබන්නේ කුඩ ලබන්නා දෙසට සිටින සේව. සම වයසේ අයට දෙනු ලබන්ණ් හරස් අතට සිටිනසේය.
තම අතින් යම් වරදක් සිදුවුන අවස්ථාවක බුලත් අතක් දී සමාව අයදුවිට එම තරහ එතැනින් නිමවේ. අවුරුද්දකට බුලත් හුරුල්ලක් දී වැදීමෙන් වසර තුළ සිදුවූ සියලු වැරදි සමාකරගනී.

නොනගතය ලබන විට වැඩිහිටියන්ගේ දෙපතුල් වල තෙල් ගා බුලත් දී වැඳීම හෙළයාගේ සිරිතකි.

විවාහයේදී බුලතින් සිදු වන්නේ මහතු කාර්‍යකි. මනාලයා මනාලියගේ නිවසට යාමට පළමුව කඩුල්ලේ සිට හෝ ඊටත් කලින් තමා සමග යන නෑදැයින් ගනනට සමානව බුලත් මනාලියගේ ගෙදර කුස්සියට ගොස් පිළිගන්වයි. එම යන පිරිසට වාඩිවීමට අසුන් පැනවීම ආහාර පාන සුදානම් කිරීමට එයින් ආරාධනා කරයි.

බුලත් ගෙනයාම හා එම කටයුත්ත භාරව සිටින්නේ එක්තරා කුලයකට අයත් අයකු විසිනි. එම කුලය අනුරපුර ශ්‍රී මහ බෝධිය සමග ලංකාවට රැගෙන ආ කුල 18 (බෝදාහාර කුල) න් එකකි. එම අය ශ්‍රීමහා බෝධියේ ආවතේව භාරව සිට ඇත.

මෙම අය පසුව රජුගේ හේවා පන්නයේ රාජකාරිය කර ඇත. එම නිසා එම අයට හේවායා (යුධ සෙබලා) යන නම කියති. රාජකාරිය කල නිසා ධුරය - දුරයා විය. නමුත් වර්තමානයේ කුලයෙන් හීන ඔහු ගැන ජනවහරේ එන ජනශ්‍රුතා ඉතාමත් රසවත්ය. නීල ගජබා රජතුමා හා රෙදි නැන්දාගේ අතියම් සබඳකමකින් ලත් පුතෙකි. ඔහු ලොකු වනතුරු රජ ගෙදරට රැගෙන ගොස් නැත. රජ ගෙදර බැලීමට ඇවිටිලි කිරීමෙන් පසුව ඔහු රජගෙදරට එක්කර ගිය මෑණියන් කිසිවක් අල්ලන්න එපා යයි කීවාය. නමුත් දඟකාර පුතා රජුගේ යාලුවා (ආයුධයක්) රැගෙන බලන විට අම්මා එය තබන ලෙස කීවාය. පුතා එම ආයුධය අනෙක් පැත්තට හරවා තැබීය. රජතුමා පැමිණීමෙන් පසුව ආයුධ කිසිවක් අල්ලා ඇතිබව දැනගනී.

රජතුමාගේ මැදුරට කිසිවෙක් පැමිණියේ දැයි විමසීය. රිදී නැන්දා පුතා සමග පැමිණිබව සැලවිය. ඔහු තමාගේ පුතෙක් බව රජු දනී. එම යාගදාව ඉසිලිය හැක්කේ තමා ලෙසට සම්බන්ධ අයෙකුට පමණි.

පුතා රජ මැදුරට ගෙන්වා ඔහු හමුදාවට ඇතුළත් කර සේනාධිපතිඳ කෙළේය. ඔහුට ලංකාවෙන් සොළිරටට ගෙනගිය දොලොස් දාහක සෙනග ලංකාවට ගෙන ඒමට අන කළේය.

ඔහු යාගදාවද රැගෙන තලෙයි මන්නාරම මුහුදු ඔස්සේ ඉන්දියාවට ගියේ තම සේනාවද සමගයි. ඒ කාලයේ මුහුදු නොගැඹුරුය. යාගදාවෙන් මුහුදට ගැසූ විට යන මග එළිවිය. ඉන්දියාවට ගොස් ඔහු කඳවුරු ළෑවේ වතුර නොමැති කඳුගැටයක් මතයි. යාගදාවේ ඇතුල් කුහරයේ වතුර සොළොස් කාලයක් (කල 16 ක්) රඳවා තැබිය හැකිය. ඉන්දියාවේ රට වැසියන් එන විට තම සේනාව වතුර ඉල්ලීමට කිවේය. එවිට වැලි අහුරක් අතට ගෙන යාගදාවෙන් මුඩිය සෙමෙන් බුලල් කර ඇත. තම අය වතුර බී පසු නැවත එය තදකර ඇත. සොළි රටේ මිනිසුන් මේ වැලි මිරිකා වතුර දෙන කතාව රජුටද දැන්විය. වැලි මිරිකා වතුර ගැනීමට තරම් ශක්තිවන්ත යෝධයෙක් ඉන්දියාව පුරාම සෙවූ නමුත් සොයාගත නොහැකිව නීල මහා යෝධයා සමගි සම්මුතියකට එළඹීමට රජුට සිදුවිය. ලංකාවෙන් ගෙන ගිය දොලොස් දහසක් සෙනග රැගෙන යාමට පැමිණි බව රජු දැනගත් පසු එයට එකඟ විය. නමුත් දොලොස් දහසට තවත් දොලොස් දහසක් වන්දි ලෙස ඉල්ලීය. එයටද රජු එකඟවිය. දොලොස් දහසට හතර දෙනෙක් අඩුවිය. එයට සිලිබල්ලන් (දෙමලිච්චෝ) 4 දෙනෙක් ගෙන ලංකාවට පැමිණිනීල මහා යෝධයා තුන් පනේට දන් පහක් එක හතරලියද්දට 400 ක් දුන්බිරට බිම්බරක් ආදී වශයෙන් මේ සෙනග ලංකාව පුරා දමා ඒ අයට ගොවිතැන් බත් කිරීමට අණ කළේය. ලංකාවේ අයට ඔවුන් කෑම දියයුතුයි. එම අයගෙන් කෑම කෑම තහනම් කළේය. ඉඳුල් නොවන සේ කෙහෙල් කොළේ (දෙවියන්ට මෙන් ලංකාවේ අයට කෑම දිය යුතු බව කියවිණි.

පිටරටින් ගෙනා නිසා මේ අය රටේ ඇත්තෝ විය. ගොවිතැන් බත් කල නිසා ගොවිගම විය. ලංකාවේ සිටි අය නිකම්ම කකා බිබී සිටි නිසා දුප්පත් විය. පසුව ඔවුන් බත බුලතින් අඩු විය. පසුව ඒ අය අඩු කුලයේ අය ලෙස සැලකූහ.

නීල මහා යෝදයා රටින් ගෙනා හැම තරුණියක්ම තම බිරියන් ලෙස තබා ගෙන ඇත. එය රජුගේද අනක්ද විය. එම අණ රැගෙන ගියේ හේවායා විසිනි. එම සිරිත මෑත කාලය දක්වාම විවාහයේදී නීල මහා යෝදයා වෙනුවෙන් හේනෙ මාමාත් හේවායා වෙනුවෙන් එම කුලයේ අයෙකුත් රැගෙන යාම සිරිතක්ව පැවතුණි.

මේ සිදුවීම කොටහලු උපත නැමැති යාගයේ දී මොනවට පැහැදිලි වේ. එය කුරුණෑගල දිහාවේ දී මාද දැක ඇත. එහිදී ඉඹුල් කොටයකින් කපාගත් නීල මහා යෝදයාගේ පිළිරුව අලුත විය පැමිණුනු තැනැත්තිය සමග විවාහ කර දෙයි. නීලයා මැරුන බව කියා පිළිබඳව සොහොනට ගෙනයයි.

යාගයට කිරිබත්, සහල්, පොල්, කෙසෙල්, කැවුම් ගොඩවල් 07 බැගින් මනාලිය වාඩි වූ පසු නොපෙනෙන තරමට තබයි. වංගෙඩිය, මෝල්ගස, කුරහන්ගල, මිරිස්ගල, කුල්ල, හට්ටි 07 ක්, වලන් 07ක් ආදී වශයෙන් ගෙදරට අවශ්‍ය හැම දෙයක්ම එහි තබයි. යාගය පවත්වන්නේ රජක (හේනමාමලා) විසිනි. එම බඩු ඔවුන් සතුය. එම බඩු හා ගැහැනිය බරට රිදී දීමෙන් තම දරුවා බේරා ගත හැක. යම් ගෙයකින් එම ද්‍රව්‍ය වෙන අයෙක් දුනහොත් ඔහුට එම ගැහැනිය හිමිවේ. මෙය ගජබාකොල්ලය නැමැති මාගේ ගමුවේ ස්වාමීන් වහන්සේ නමකගේ පොතක විස්තරව ඇත.

බුලත්විඩ ගෙදරට පැමිණි අමුත්තාට පළමුව පිළිගැන්වීමද සිරිතකි. මගුලේදී බුලත් පිළිගැන්වීමේ දී බුලත් තහංචියක්ද සිදුවිය. එම තහංචිය මනාලයාගේ පිරිස විසින් තහංචි හැර අනුබව කළ යුතුය. මනාලයා විසින් පොඩි බුලත් මල්ල, මහ බුලත් මල්ල වශයෙන් කොටස් දෙකකට ගෙනයාම අතැමි පලාත්වල සිරිතකි. මගුල් පෝරුවට අවශ්‍ය බුලත් මනාලයා විසින් සැපයිය යුතුයි. මගුල් පෝරුවට බුලත් මිටියක් කුස්සියට බුලත් මිටියක් ද, අත්‍යාවශ්‍ය විය. කුස්සියට බුලත් නොදුනහොත් නෑදෑයන්ට කෑම බීම ප්‍රමාද කරනි.

මගුල් පෝරුවේ දී විවාහ වූ පසු මවට පියාට බුලත් දී වැඳීමද හත්මුතු පරම්පරාවෙන් අවසර ගැනීමට බුලත් අත් 7 ක් පොරුවට දැමීම සිරිතකි. පැමිණි සියළු දෙනාටම බුලත් දී වැදිය යුතුයි. පිටව යාමේ දී කඩුල්ලේ ඇවැස්ස මස්සිනා රැක සිටී. ඔහුටද බුලත් අතක් ලේන්සුවක් මත තබා දී ඔහුගෙන්ද අවසර ගත යුතුයි. ලේන්සුව මස්සිනා ගතහොත් කඳුළු පිස ගන්නා ලෙසද මනාලිය අල්වා ගතහොත් නෙත් පපුවක් නැති ස්ත්‍රියක් යැයිද කියා සිනාසීම සිදුකරයි.

බුලත් තහංචිය

සත් පත්තිනි දෙවියන් වැඳ ගතිමි	වරං
උත්තම දෙමව්පිය පැවැද ගතිමි	වරං
සෙත් සිරි දෙවන ගුරුවරු වැඳ ගතිමි	වරං
මේ සිටි සබේ වැඳ අවසර ගතිමි	වරං
දෙරණ යටට නාග බවන පැවැති	සිරිතකුත්
උරණ නොවී නාග රජුට කරති රැක	වලුත්
පරණ අපේ මිතුරු සබේ නොසිතට	උරනත්
නොකන ලෙසට තහංචි කර තබමි මේ	බුලත්
නාගලොවේ නා මිදුලේ බුලත්	උපන්නේ
මන්ත්‍ර පසක් ලියලා ඒ මුල සිට	වන්නේ
මන්ත්‍ර පසට සැම දෙවියෝ දිෂ්ටි	හෙලන්නේ
මන්ත්‍ර බලෙන් බුලත් වට්ටි තහංචි	වන්නේ

තහංචි හැරීම

මහ කොළ මහ නාග රාජා බුලත් ගෙනාවේ	එමවිට
බුලත් වට්ටි සාදා සිට පුජා කෙරුවයි	මුනිඳුට
දැහැත් වළඳමින් මුනිරජ පින්පෙත්දුනි නාග	රජුට
ඒ අනුහසින් තහංචි නැත බුලත් වට්ටි ගන්ට	අපට

තවත් තහංචියක්

නාග ලොවේ නාග ලතා ගෙනත්	සඳන්නේ
මෙරඟ වෙසෙන සැම දෙවිඳුට දළුමුර	දෙන්නේ
වේග නොවී තිසරණ ගුණ සරණ	බුදුන්නේ
කල තහනම් දුරුර බුලත් සහයට	දෙන්නේ

අතට ගැනීමත් තහංචිකරය

උගත් අයෙක් ලෙස ඇවිදින් නොමදැන	පිළිවෙල
මමත් එක්ක කවි කීමට ආවේ මෙම	කල
උගත් කමට බැන්දෙවි ගිනි ගණ මුල්	කල
බුලත් තටුව අතට ගත් තහංචි මම	කල

තහංචි හැරීම

වේග වලා නුඹ ආමුත් නොමදැන	පිළිවෙල
වේග නොවෙමිළු ගැන උඹ අනපං	විස්තර
දේව ගනේ අනුහසයෙන් තහංචි	සුන්කර
නාග වල්ලි බුලත් තටුව ගන්නට	අවසර

තහංචි හැරීමෙන් පසුව බුලත් ගෙන කෑම සිදුවන අතර ඉන් අනතුරුව අනෙකුත් සංගුහද ලබන්නේය.

මහ කෙල නාග රාජයා බුදුන් වහන්සේට දීම සඳහා නාගලොවේ සිට තටුව හා තුඩ කටින් ගෙන පැමිණි බව ජනප්‍රවාදයේ පවතී. එමනිසා දෙකොන කුඩා බුලත් කෑමද හෙළයාගේ සිරිතකි.

මනාලයා මනාලියගේ නිවසින් පිට වීමට පෙර බුලත් විටක් ඉල්ලා කෑමද සිරිතකි.

නොලස් සුදුසු බව සිදුවෙයි කල	වන්න
කලත් උපකාර බෑ නොකියා	ඉන්න
මැරුනත් ගොසින් එක නුවරක උප	දින්න
බුලත් විඩක් දෙනවද කාලා	යන්න

බුලත් විඩ ලැබුණු පසු

සතර කැලේ කල ගොවිතුන්	සරුවන්නට
අතරතුළේ දුප්පත්කම නැති	වන්නට
චතුරසේම රෝදුන් දුරලා	යන්ට
සතර වගේ ලැබුනා මට	විටකන්ට

කඩුල්ලේ සිට මස්සිනා බුලත් ඉල්ලීම

නාග ලොවේ වද බුලත්	උපන්නේ
ගසේ ගොසින්වද බුලත්	කඩන්නේ
ඇවැස්ස මස්සිනා මමයි	බොලන්නේ
කඩුළු බුලත් ටික දීලයි	යන්නේ

බුලත්වල දෙකොන කඩා දැමීමේදී බුලත් කොලේ විෂ පහ වන බවත් දෙකොන ලොකුවට කඩා දැමීම නාස්තිකාර කමේ ලක්ෂණයක් ලෙසත් බුලත් කොළය සම්පූර්ණයෙන් කෑම ඉතිරි නොකරන අයගේ ලක්ෂණයක් ලෙසත් පැරැණිනෝ සැලකූහ.

මෙතරම් ගරු කටයුතු බුලත මගුල් පෝරුවට දමා කිසි දිනක නොපාගන සහල්ද මුදල්ද ඒ මත දමා මගුල් පෝරුවේදී හැම දෙනා ඉදිරියේ දී දිවිරුම් දීමකි සිදුවන්නේ. එක ගෙයක වෙසෙන බව ප්‍රකාශ කිරීමක් වශයෙන් මගුල් පෝරුවේ උඩ වහලක්ද තිබිය යුතුයි. නමුත් නව විලාසිතා අනුව මගුල් පොරුවෙන්ද එම සිරිත බහාරුව යමින් පවතී.

කුල වශයෙන් උස් පහත් ලෙස සලකතත් කෑමබීම නොගැනීම සිදුවුනත් බුලත් වලට ඒ කිසිවක් බල නොපායි. ඕනෑම අයකුගෙන් ඕනෑම අයෙකුට බුලත් පිළිගැන්වීම ගරු කටයුත්තක් ලෙද ආදී හෙළයෝ සිතූහ. බුලත් හා බැඳුනු අපේ සිරිත් තවත් සෙවිය යුතුය.

වී. ජී. මිගෙල් (සරත්)
මොණාරාගල, ශ්‍රී ලංකාව
දු.ක. 055 - 4923788

පරිගණක අලුත්වැඩියාව
Professional Services
Computer Repairs & Upgrades
Virus Removals
ADSL Professional installations
Networking
Brand New Computers for sales
Laptop screen repairs
Trouble shooting Browsing, E-mail & internet connection issues
All Computer parts for low price
Jithendra Weerakoon
(IT Consultant)
02 Mosstrooper Court
Mill Park
Victoria, 3082
Australia
M: 0422 662 218
T: 03 9005 0893
E: jaytec@tpg.com.au
E: jith710@hotmail.com